

# තල හේනේ යක්කු

## උදිත ගමගේ
## ලියන කෙටි කතාව

"දැන් වෙලාව කීයද? මහත්තයෝ ..........?

සිරිසේන ගමන් කරමින් සිටි වාට්ටුවක ලෙඩෙක් ඔහුගෙන් ඇසුවේය. ගමන මදක් බාල කරමින් ඔහු දෙසට හැරුනු සිරිසේන,
"මොකද කොහෙවත් යන්නද? ...? දැන් වෙලාව 6.45 යි"
සිරිසේන තම කමිස සාක්කුවේ තිබූ ඔරලෝසුවේ මුහුණත බලා ලෙඩා වාට්ටුවේ එළියේ වූ බැංකුවක වාඩිවූවේය.
'එහාට මෙහාට ගිහින් කකුල් කඩෙත්තුව'
සිරිසේන තම දණ හිසත්, බත්කෙණ්ඩත් අතගාමින් සිතුවේය. එවිටම තම බෑගයේ වූ යමක් පිළිබඳ ඔහුට සිහිවිය.
'එක්කෝ ඕන නෑ.... බීලා කියල දැනගත්තොත් වස වැරැද්ද...' තවත් පැයක් හමාරක් වැඩකොට යා යුතුයැයි සිරිසේන සිතුවේය. සාමාන්‍ය රාජකාරිය තුළ හෙතෙම එතරම් උනන්දුවකින් වැඩ නොකලත් අතිකාලයේ දී හේ පෙරට වඩා මදක් උනන්දුවෙන් රාජකාරි කළේය. වසර පහළොවක තම රාජකාරි දිවියේ සිරිසේනගේ තුන්වන රැකියා ස්ථානය වූයේ කුරුණෑගල මහ ඉස්පිරිතාලයයි. එයින්ද ඔහු වඩාත් අකමැතිම රාජකාරිය වූයේ මෝචරියේ කටයුතුවලට සහභාගි වීමය.

තවත් විනාඩියක් දෙකක් හුන් තැනම දණ හිස් අතගාමින් සිටි සිරිසේන යළිත් වාට්ටුව හරහා ආපසු ගියේය.වැඩ නිමවා නිවසට යාමට වෙලාව ළංවී තිබූහෙයින් තම බෑගය තබා ඇති කාමරයට ගිය සිරිසේන තම නිල ඇඳුමේ කොටසක් වූ ඒප්‍රණය ගලවා දැමුවේය. එවිට එතුල සාක්කුවක තිබී රුපියල් විස්සක් බිමට වැටුණි. එසේ හතරට පහට නැවූ මුදල් නෝට්ටු කිහිපයක් ඔහුගේ සාක්කුවල, ඉනේ බැඳ තිබෙන බඳ පටියේ විය. ඒවා බොහොමයක් සන්තෝසම් ලෙස ලැබුණ මුදල් විය. බොහෝවිට වෛද්‍ය වරයකු මුනගැසීමට නොම්බරයක් ලබා ගැනීමට, ලෙඩෙකුට ඇඳක් ලබා ගැනීමට, නැත්නම් ලෙඩෙකු ගැන සලකා බලන්නයි කියා හෝ ඉස්පිරිතාලේ වියදමින් වලදැමූ අයෙකුගේ විස්තරයක් බලා ගැනීමට, යමෙකු විසින් මෙසේ කීයක් හෝ සිරිසේනලාට අතමිට මෙලවීම සාමාන්‍ය දෙයක් විය. ඇතැම්විට කෑම බීමද එසේ පැමිණි අයකු විසින් දෙන්නේ;
"ගන්ට මහත්තය, මුන්නැහේ මේ දවස්ටිකේ අපට කොච්චර පාසුවක් කලාද?... අයෙතේ ආගිය වෙලාවක මෙහෙම දැනකියා ගෙන ඉන්න එක කොච්චර එකක් ද?" යි පවසමිනි.

තැන් තැන්වල සඟවා ගත් මුදල් එක්කොට පසුම්බියේ ලා ගත් සිරිසේන ගෙදර යාමට පිටත්විය. බසයක නැගී ටවුමට පැමිණි ඔහු ගෙදර ගෙනයාමට පාන් රත්තලක් මිලට ගැනීම සඳහා රත්නගිරියට ගියේය. ඉන් එළියට එනවිට, "සිරිසේන අයියේ" කියමින් කිසිවෙක් පිටට තට්ටු කළේය. තිගැස්සී හැරී බැලු කළ දුටුවේ සිනා මුසු මුසුණින් තමා දෙස බලා සිටි පියසුමනයි.

"අඩේ, පියසුමන මලයා... කොහේදෑ මේ."
"මං මේ මළගෙදරක ගියානේ, මීගොල්ලෙ... උඹව දැක්කෙත් අහම්බෙන් ..."

පියසුමන සිරිසේනගේ ඇවැස්ස මස්සිනා වූ අතර ඔහුත් ගල්ගමුව රෝහලේ සේවය කළේය.
"ඒක නෙවේ මොනවා හරි කරමුද?.. යන්න හදිස්සියක් නෑනෙ,ගල්ගමුවෙද යන්නේ...?"
සිරිසේන තම ඥාති සොයුරාට ආරාධනා කරමින් ඇසුවේය.
"අනුරාධපුර බස් එක නවයට... තව පැය එකහමාරක් ඇති." හෙතෙම සාක්කුවේ තිබූ ඔරලෝසුව බලා කීවේය.
"ආ එහෙනම් යමං කෝ.."
අසල පිහිටි "රියෝ" අවන්හලට ඇතුළු වූ දෙදෙන අසුන් ගැනීමට තැනක් පිරික්සුවෝය.

"අතනින් වාඩිවෙමුකො.." පියසුමනට අසුනක් පෙන්වූ සිරිසේන කවුන්ටරය වෙත ගොස් ගල් බෝතලයක් ඇනවුම් කළේය.
"තව සෝඩ දෙකයි, ඌරු මස් දීසි දෙකයි....."
පියසුමන තමා අසලට පැමිණි සේවකයාට පැවසීය.

ආ ගිය තොරතුරු විමසීමෙන් පටන්ගත් අල්ලාප සල්ලාපය පැයක් පමණ ගිය තැන බෝලතයද, මස් දීසි දෙකද අවසන් වෙමින් තිබුණි.

"මොකක් වෙලාද උන්දැ මැරිල තියෙන්නෙ.....?"
සිරිසේන පියසුමනගෙන් මළ ගෙදර විස්තර ඇසුවේ බොහෝ වේලාවකට පසුවය.

"ඒ මාමණ්ඩි නම් වයසයි. ඒත් උන්දැට යකෙක් ගහල තමයි කියන්නේ" පියසුමන කීවේය.
"යක්කු.. පුහුඃ ... මොන බොරුද?" සිරිසේන අඩවන් නෙතින් සිනාසුනේය.
"ආ.. ඇයි උඹට මතක නැද්ද අපේ පොඩි නැන්දම්මටත් ලොකු තොයිලයක් කළා.."

"කළා තමයි.. ඒ පස්සෙන් ඇවිත් තියෙන්නේ මොකෙක් හරි මිනිහෙක් වෙන්නැති." "අපේ අපුච්ච නම් කීවෙ එඋන්දැගෙ වාහෙ කළු අප්පුහාමි වෙන්ඩැ කියල."

අවතාර හොල්මන් ගැන ඇතුළු අනෙකුත් කතා අවසන් කොට බිල ගෙවා දෙදෙනාම ඉන් පිටතට පැමිණියෝය. සිරිසේන නාරම්මල බසයට ගොඩ කළ පියසුමන අනුරාධපුර බස් තැවතුම කරා නික්ම ගියේය. බසයේ අසුන්ගත් සිරිසේන ඔරලෝසුව පිටතට ඇද වෙලාව බැලුවේය." නවයට පහයි..." නැවතත් ඔරලෝසුව සාක්කුවේ දමා ගත් සිරිසේන බස්රථයේ ජනේලයට හේත්තුවී කල්පනා කළේය. එකවරම අද දින මෝචරියට ගෙන ගිය මළමිනිසකු ඔහුට සිහිවිය. ගෙළ වැලලාගෙන මියගොස් සිටි ඔහුගේ දිව එළියට විත් තිබුණි. ඇස් ඇරී තිබුණි. සිරිසේනට එකවර තිගැස්මක් ඇතිවිය. තවද පියසුමන සහභාගිවූ මළගෙදර මියගොස් සිටි තැනැත්තාගේ පිටේමහසෝනාගේ අත්පාරක්ද තිබූ බව මළගෙදර සිටියවුන් කී කතාවක්ඔහු කී අයුරුද සිරිසේනට සිහිවිය.

සිරිසේන තම පිට අතගෑමට අත දිගු කළවිට සීතල අතකින් තම පිටට තට්ටුවක් දැම්මේය. සිරිසේන ගැස්සී ආපසු හැරුණු විට අතෙහි වූ බෑගය බිම වැටිණි.

"මොකෝ ... බය උනාද? ... කොහෙටද ටිකට්? .. මුව පුරා රැවුල වවාගත්, නොසෑහෙන්න විට කා කට රතු කරගත් බඩ මහත එකෙකු තමා දෙස දත් විලිස්සා බලා උණි.

"කොහෙටද උන්නහේ..? ඔහු යළිත් ඇසූ කළ හේ බස් රථයේ කොන්දොස්තර තැන යැයි සිරිසේනට සිහිවිය.
"උහුමීයට..." සිරිසේන මුදල් කොන්දොස්තර තැන වෙත දිගු කරමින් කීවේය.

තිබ්බටුවැව පිහිටියේ උහුමීය හන්දියෙන් හැරී සැතපුම් තුනක් පමණ තාරපාර දිගේ ගොස් තලහේන හන්දියෙන් ද හැරී තවත් සැතපුම් බාගයක් ගිය තැන්ය. මෙකල ඒ මඟ දෙපස බෙහෙවින් අභිමාන විය. උහුමීය හන්දියේ සිට තිබ්බටුවැවට යන අයෙකුට පාර අයිනේ හමුවන්නේ පේළියට සිටවූ පොල් ගස් සහිත විශාල පොල් ඉඩම් සහ ඒවායේ කැලෑ වැටුණු ඇල්බීසියා වැටවල්ය.උස්ව වැඩුණ ගස් අතු මුදුන් මදුවැල් වලින් එකිනෙක සමග එතී වියනක් ලෙසින් දිස්විය. මේ මගෙහි කඩ දෙකක් තිබූ අතර තලහේනෙන් හැරී තිබ්බටුවැවේ කන්ද උඩ ගෙදරට ළංවන තුරුම නැවතත් වැඩුණු තුරු ගොමුවලින් යුත් නිවෙස්වලින් තොර පෙදෙසකි.ඒ අසල පාරට පෙනෙන තරමේ නුදුරින්, අවට ගම් කිහිපයක් වෙනුවෙන් වෙන්කල සොහොන් පිටියක් ද විය.එහි එක් පැත්තක මායිමේ සරුවට ඉතා සරුව වැවූ හේනක්ද විය.

විදුලි බලය ගැන සිහිනෙන්වත් නොපැතූ මෙම ඇතුළු ගම්වල සිටි බොහෝ ගැමියෝ, ඇහැකණ පෙනෙන යාමේ නිවෙස්වලට ගාල් වූහ. ඔවුහු කුප්පි ලාම්පුවේ, එළියෙන් කාබී වැඩ අවසන් කොට නිදාගත්තෝය. ඉඳහිට ගමේ යමක්කමක් තිබූ ගෙයක ගුවන්විදුලිය ලඟ වාඩිවූ පිරිසක් " මුවන්පැලැස්ස", "කුරුළු බැද්ද" හෝ "හන්දියෙ ගෙදර" ගුවන් විදුලි නාටකවලට සවන් දුන්නෝය.

උදේ පටන් රස්තියාදුවේ යමින් හිඳ සවස ඇළට බැස ඉබ්බන් අල්ලමින් සිටි යෞවනයන් දෙදෙනෙකි. ඔවුහු රාත්‍රියේ දී කළ යුතුවූ යමක් පිළිබඳ සාකච්ඡා කරමින් උන්හ.
"මේ සේනයො වැඩක් නම් තියනව කරමුද?" එකෙක් අනෙකාගෙන් විමුසුවේය.
"මොකක්ද?..."
"මුරකාරයගෙ හේනේ මඤ්ඤොක්කා වැවිලා සාරෙට"
"හම්.. මාත් දැක්කා.. "
"දෙමුද වැඩක්... කරනවනම් අද තමයි දවස"
"අම්මෝ මුරකාරයට අහු උනොත් අපේ ඇට තලයි...'
"ඌට අහුවෙන්න නෙමෙයි ගොනෝ.. අද රෑට එගොඩහ තොවිලයක්නෙ, ඉතින් ඌත් යනවනෙ තොයිල් බලන්න... එන්න කලින් ගලෝමු.."
"ඈ තිලකයො හේන තියෙන්නෙ කැරකොප්පුව ලඟ නේද?" සේන ඇස් මහත් කොට ඇසුවේය.
"ඉතින් ඔබට බයද? ...ඕකෙ ඇති යකෙක් නෑ බං.." "මොකෝ කියන්නේ?" යි තිලක ඇසූවිට සේන ඔළුව කසමින් කල්පනා කළේය.

එදින සැලසුම් සිතූ ලෙස ක්‍රියාත්මක කළ හැකි විය. මුරකාරයා යන්තම් කළුවර වැටීගෙන එන විට තොවිල් පල වෙත ගියේ තවත් කිහිප දෙනෙකුද සමඟය. ඈතින් පදම් කරන යක්බෙරයේ හඬ විටින් විට ඇසුණි. අඳුර වටින් ගොඩින් පරිසරය ගිලගන්නා විට ඇඟපතෙහි




RESIDENTIAL DESIGNS, PLANS & PERMITS

RANJITH WANNINAYAKE
B.Sc(BE),M.Sc(Arch),AIA(SL),Dip Ineterior(NSW)
Registered Building Practitioner DP-AD 43423
Member of the Building Designers Association of Victoria 3862
Chartered Architect (SL) A0476

20years exp.

- FREE ADVICES
- PLANS—SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS
- CORDINATING OTHER CONSULTANTS WORK

REGISTERED Building Practitioner
bdav

3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com